**බියගම ප්‍රාදේශීය සභාව - 2022**

-----------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1. තත්ත්වාගණනය කළ මතය**

බියගම ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බියගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති අංක 90 සහ මූල්‍ය ප්‍රකාශනයෙහි ගිණුම්කරන ප්‍රතිපත්ති අංක 3.6 අනුව ආදායම උපචිත පදනම මත ගිණුම් ගත කළයුතු වුවත් මුද්දර ගාස්තු හා උසාවි දඩ, මුදල් පදනම මත ගිණුම් තබා තිබුණි. | ඉදිරියේදී ගිණුම් ප්‍රතිපත්තිය නිවැරදිව සටහන් කර ගිණුම් පිළියෙළ කරන බව. | උපචිත පදනම මත නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් වටිනාකම රු.1,103,733 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | විශාලත්වය පර්චස් 75 ක් හා වටිනාකම රු.8,000,000 ක්වූ ඉඩම් 02 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම් පිළිබඳ විස්තර ලබා ගැනීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | වටිනාකම රු.58,789,453 ක් වූ ගොඩනැගිලි ඉදිකර ඇති ඉඩම් 28 ක් අගය කර ඉඩම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි. | ගොඩනැගිලි සහිත ඉඩම් 15 ක්, ඉඩම් උප ලේඛනයට ඇතුලත් කර ඇති බව. | -එම- |

**1.7. අනුකූල නොවීම්**

1.7.1 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරු කරන ආඥා පනත වගන්ති අංක 20 | 2008 සහ 2012 වර්ෂවල තක්සේරු පදනම් කරගෙන වරිපනම් අයකරගෙන තිබුණි. | තක්සේරුව ලද වහාම නව තක්සේරුවට වරිපනම් අය කරන බව. | තක්සේරුව කරවාගෙන, ඒ අනුව වරිපනම් අය කල යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභා මූල්‍ය රීති අංක 60 | මාණ්ඩලික නොවන නිලධාරීන් 19 දෙනෙකු වෙත රු.100,000 ඉක්මවා වටිනාකම රු.5,370,575 ක් අත්තිකාරම් ලෙස ලබාදී තිබුණි. | වර්තමානයේදී මූල්‍ය රීති අනුව අත්තිකාරම් මුදල් ලබාදීමට කටයුතු කර ඇති බව. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු රු.188,532,345 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු. 128,555,443 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1. ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 78,530,710 | 78,878,277 | 72,893,953 | 72,855,554 | 78,862,188 | 78,408,979 | 68,095,859 | 66,871,230 |
| (ii) | කුලී | 7,679,130 | 7,184,542 | 6,374,447 | 11,218,577 | 7,794,050 | 7,686,470 | 6,083,182 | 10,408,482 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 6,318,000 | 5,778,977 | 5,778,977 | | 6,094,000 | 4,979,665 | 4,979,665 | 30,000 |
| (iv) | වෙනත් ආදායම් | 29,683,100 | | 42,557,868 | | 48,205,100 | | 59,611,620 | |
| | | 122,210,940 | 91,841,796 | 127,605,245 | 84,074,131 | 140,955,338 | 91,075,114 | 138,770,326 | 77,309,712 |

#### 2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට වරිපනම් හා බදු හිගව පැවති කාලය වසර 10 ට වැඩි ශේෂය රු.16,714,446 ක්ද, වසර 5 ත් 10 ත් අතර ශේෂය රු.17,224,668 ක්ද, වසර 3 ත් 5 ත් අතර ශේෂය රු.13,316,058 ක්ද විය. | අයකර ගත නොහැකි ආදායම ලේඛනවලින් ඉවත් කිරීමටත්, උප කාර්යාල මට්ටමින් අයකිරීමටත් කටයුතු කරමින් පවතින බව. | පනත අනුව හිඟහිටි වරිපනම් අය කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් ශේෂය තුළ, වර්ෂයේ ආරම්භක වෙළඳ ස්ථාන කුලී ශේෂය රු.8,801,527 කින්, අය කළ වටිනාකම රු.432,705 ක් වූ අතර වසර 5 ත් 10 ත් අතර හිඟහිටි ශේෂය රු.8,281,742 ක්ද, වසර 3 ත් 5 ත් අතර හිඟහිටි ශේෂය රු.1,023,480 ක්ද විය. | 2023 වර්ෂයේ හිඟය අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව. | ගිවිසුම් අනුව හිඟහිටි වෙළඳ ස්ථාන කුලී අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) මහජන පැමිණිලි**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාවට ලැබී තිබුණු මහජන පැමිණිලිවලින් 431 ක් විසඳා නොතිබුණි. | පැමිණිලි විසඳීමට ක්‍රියා කරමින් පවතින බව. | මහජන පැමිණිලි විසදිය යුතුය. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය බැහැරලීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.12,896,471 ක් ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට ගෙවා තිබුණු අතර, 2022 වර්ෂයට පෙර කාලයට අදාලව රු.21,204,062 ක් ගෙවිය යුතුව තිබුණි. එසේ වුවත් සභාව විසින් කසළ උපයෝගී කර කොම්පෝස්ට් නිපදවීම සිදුකර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට දිරන කසළ උපයෝගී කර ගනිමින් ජීව වායු හා දියර පොහොර නිපදවීමට කටයුතු කරමින් පවතින බව. | සුදුසු ඉඩමක් මිලදීගෙන කසළ කළමනාකරණය කළ යුතුය. |

**(ඇ) පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කරන ආදාහනාගාර 2 ක සඳහා බලපත්‍ර ලබාගැනීමට 2023 මාර්තු මස වන විටත් කටයුතුකර නොතිබුණි. | 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 අති විශේෂ ගැසට් පත්‍රයේ උපලේඛන (ඇ) හි සඳහන් අයිතම 39 තුල ආදාහනාගාර ඇතුලත් නොවන බව. | පනත ප්‍රකාරව අදාහනාගාර සඳහා පාරිසරික බලපත්‍ර ලබා ගත යුතුය. |

### 3.2. කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ණයගැති ශේෂය රු.21,629,511 ක් විය. | මුදල් ප්‍රතිපූර්ණය වෙමින් පවතින බව. | ණය ගැති ශේෂ නිරවුල් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ණය හිමි ශේෂය රු.135,277,013 ක් විය. | ඉදිරියේදී මුදල් ප්‍රතිපූර්ණය වීමට නියමිත බව. | -එම- |

### 3.3. මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත්වී නොතිබුණු, මන්ත්‍රී මණ්ඩලයේ ආකල්ප සංවර්ධනය පිලිබඳ දෙදින පුහුණු වැඩමුළුවක් පවත්වා ඒ සඳහා සේවක පුහුණු වැය විෂයයෙන් සියයට 57 ක වටිනාකම වන රු.855,370 ක් වැයකර තිබුණි. | වැඩසටහන මහා සභා අනුමැතිය ලබා ගෙන කරන ලද්දක් වන අතර සභාවේ කාලයද අවසන්ව නොතිබිණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කළ යුතුය. |

### 3.4. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත දේපළ පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.1,100,000 ක් වූ ගොඩනැගිල්ලේ උඩ තට්ටුවේ වැඩ අවසන්කර නොමැති බවත්, ගොඩනැගිල්ල දිරාපත් වී ඇති බවත් නිරීක්ෂණය විය. | ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිදේශයන්ට අනුව කටයුතු කරමි. | වත්කම් ආරක්ෂා කළ යුතුය. |

### 3.5. වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.72,880,000 ක් වූ ඉඩම් කැබලි 24 ක නාම පුවරු නැති බවත්, මායිම් නිසි පරිදි සකස්කර නොමැති බවත්, නිරීක්ෂණය විය. | මායිම් සකස් කර පුවරු සවි කිරීමට කටයුතු කරන බව. | ඉඩම් කැබලි මිනුම් කර නාමපුවරු සවි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වටිනාකම රු.479,000 ක් වූ නාන ළිං 4 ක් සොයාගත නොහැකිව තිබුණු අතර වටිනාකම රු.1,854,000 ක් වූ නාන ළිං 5 ක් අනවසරයෙන් වෙනත් පාර්ශවයන් විසින් භාවිතා කර තිබුණි. | ඉදිරියේදී ගත යුතු ක්‍රියාමාර්ග ගන්නා බව. | ගිණුම්ගත කර ඇති ඉඩම් භෞතිකව තිබිය යුතුය. |
| (ඇ) | වටිනාකම රු.500,000 ක් වූ ගොඩනැගිල්ලේ අයිතිය සනාථ වී නොතිබුණු බවත්, වටිනාකම රු.100,000 ක් වූ සුසාන භූමි 2 ක් පුද්ගලික සුසාන භූමි ලෙස පවතින බවත්, වටිනාකම රු.500,000 ක් වූ සුසාන භූමියේ කතෝලික පල්ලියක් ඉදිකර ඇති බවත් නිරීක්ෂණය විය. | කමිටු නිර්දේශ අනුව විසඳුම් සෙවීමට කටයුතු කරන බව. | සභාව සතු වත්කම් ආරක්ෂාකර ගත යුතුය. |

## 3.6. මානව සම්පත් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සේවය අතහැර ගිය, විශ්‍රාම ගිය සහ මිය ගිය නිලධාරීන් 6 දෙනෙකුගෙන් ණය හා අත්තිකාරම් ශේෂය රු.1,045,540 ක් අයවීම් හිඟ හිටව පැවතුණි. | ඉදිරියේදී අය කිරීමට කටයුතු කරමි. | සේවක ණය අය කළ යුතුය . |